මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/REG/CIR/2024/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.11.06

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 04 /2024

අමාත්‍යාංශ ලේකම්වරු
විශේෂ වියදම් ඒකකවල ප්‍රධානීන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරු
රජය සතු ව්‍යවසායන් ඇතුළුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන්

**2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වගන්තිය ප්‍රකාරව, යම් නිශ්චිත කාර්යයක් සඳහා නීතියෙන් වෙන් කර නොමැති අරමුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එබැවින්, ඉතා විශේෂිත තත්වයන් යටතේ මිස, ඒකාබද්ධ අරමුදලෙන් බැහැරව කිසිදු අරමුදලක් පවත්වා ගැනීම සිදු නොකළ යුතු ය. එසේ වෙතත්, විවිධ රාජ්‍ය අස්තිත්වයන් යටතේ ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයක් පවතින බව වාර්තා වී තිබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය පාලනයට අනුගත වන පරිදි මෙකී ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සඳහා, එම අරමුදල් ස්ථාපිත කර ඇති අරමුණු, වත්මන් සන්දර්භය තුළ එම අරමුදල්වල සැබෑ අවශ්‍යතාවය සහ එම අරමුදල්වල නීත්‍යානුකූලභාවය යන කරුණු මනාව සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

03. මෙවන් පසුබිමක් තුළ, ව්‍යවස්ථාපිත අරමුදල්වල කළමනාකරණය, පාලනය, අධීක්ෂණය සහ වගවීම ඉහළ නැංවීම සඳහා නිශ්චිත විධිවිධාන කිහිපයක්ම හඳුන්වා දීමට 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (PFM) පනත යටතේ පියවර ගෙන තිබේ. එකී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 වැනි වගන්තියේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පිළිබඳ පහත සඳහන් විශේෂ විධිවිධාන අඩංගු වේ.

**"මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතු ය:**

**එසේ වුව ද, එම අරමුදල දිගටම පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත් නියම කරනු ලබන පරිදි එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ය."**

04. එබැවින්, එසේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කර නොමැති අරමුදල් සම්බන්ධයෙන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ ද එකඟතාවය මත, එම අරමුදල විසින් දැනට සිදු කරගෙන යනු ලබන කටයුතු ඒකාබද්ධ අරමුදල හරහා වෙන් කරනු ලබන අරමුදල් උපයෝගී කර ගනිමින් ඉටු කිරීමට නොහැකි වන්නේ නම් එය මුදල් අමාත්‍යවරයා හට ලිඛිතව තහවුරු කිරීමට කටයුතු කළ යුතු ය.

05. එහිදී, රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, අදාළ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට, දැනට පවතින ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල මෙහෙයුම් මින් ඉදිරියටත් පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි නිගමනය කරන්නේ නම්, ඉහත 04 ඡේදයේ දක්වා ඇති පරිදි අදාළ ව්‍යවස්ථාපිත නොවන අරමුදලෙහි/අරමුදල්වල මෙහෙයුම් ඉදිරියටත් පවත්වාගෙන යාමට හේතු නිසිලෙස සාධාරණීකරණය කරමින් 2024 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රථම ඒ බව භාණ්ඩාගාර ලේකම්වරයා වෙත වාර්තා කළ යුතු ය.

06. එවැනි ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවක් විසින් එම ඉල්ලීම් සමාලෝචනය කරනු ලැබේ. එම කමිටුව විසින් තම ස්ථාවරය සාධාරණීකරණය කිරීමට අදාළ රේඛීය අමාත්‍යාංශයට අවස්ථාව ලබා දෙනු ඇත.

07. ඒ අනුව, එම කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අදාළ ව්‍යවස්ථාපිත නොවන අරමුදලේ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුද නැතහොත් එම අරමුදල අවසන් කිරීමට කටයුතු කළ යුතු ද යන්න සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිගමනය ලබා ගැනීමට භාණ්ඩාගාර ලේකම්වරයා විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

08. මුදල් අමාත්‍යවරයාගේ නිගමනය ලබා ගැනීමෙන් අනතුරුව, එම අරමුදල ඉදිරියට පවත්වාගෙන යන්නේ නම්, විශේෂ පනතක් සම්මත කිරීම හරහා අදාළ අරමුදලට නෛතික වලංගුතාවක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. එම පනතේ අනෙකුත් කරුණු අතර අදාළ අරමුදලේ නිශ්චිත අරමුණු, බලතල, කාර්යයන් සහ පාලක මණ්ඩලයේ වගකීම් මෙන්ම එහි ආදායම් ප්‍රභවයන් සහ වියදම්, ගිණුම්කරණය සහ විගණනය ඇතුළත් විය යුතුය.

09. ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වසා දමන්නේ නම්, පහත පියවර අනුගමනය කළ යුතුය. තවද අරමුදල යටතේ පැවති වගකීම් නිරවුල් කිරීමෙන් පසු අරමුදලේ අතිරික්තයක් තිබේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ද කටයුතු කළ යුතු ය.

i) යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක්, එහි රේඛීය අමාත්‍යාංශය විසින් ස්වේච්ඡාවෙන්ම අවසන් කිරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ, මුදල් අමාත්‍යවරයාගේ නිගමනය මත පදනම්ව අවසන් කිරීමට කටයුතු කරන්නේ නම්, එකී රේඛීය අමාත්‍යාංශය විසින් අමාත්‍ය

මණ්ඩල අනුමැතිය ලබා ගෙන අදාළ ව්‍යවස්ථාපිත නොවන අරමුදල 2025 ජූලි 31 වන දිනට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතු ය.

ii) එසේ අරමුදල් අවසන් කිරීමට අදාළ තොරතුරු, අරමුදල අවසන් කළ දින සිට සති හතරක කාලයක් ඉක්මවීමට පෙරාතුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිසි ලෙස දැනුම් දීමට කටයුතු කළ යුතුය.

10. තවද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 67 සහ 68 වගන්ති ප්‍රකාරව, මෙම පනතට අදාළ ව්‍යවස්ථාපිත අරමුදල් කළමනාකරණය පිළිබඳ රෙගුලාසි මුදල් අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව ඔබේ අවධානයට යොමු කෙරේ. එසේ රෙගුලාසි, උපදෙස් සහ විධාන ප්‍රකාශයට පත් කරන තුරු, 1992 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද රජයේ පවත්නා මුදල් රෙගුලාසි සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හා මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අරමුදල් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට පටහැනි නොවේ නම් මිස, මින් ඉදිරියටත් බලපවත්වනු ඇත.

11. 0112-484618 යන දුරකතන අංකය හරහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

අත්.කළේ කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති